**ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරයේ ප්‍රමුඛ ආයතනය සමග ඔබත් එක්වන්න**

# ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යනු සංචාරක ව්‍යාපාරය සහ ඒ ආශ්‍රිත කර්මාන්ත සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, නියාමනය කිරීම සහ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා පැවරී ඇති රජයේ අධිකාරිය වේ. සංචාරක ක්ෂේත්‍රය අනාගතය සඳහා ජාතික ආර්ථිකයට තීරණාත්මක දායකත්වයක් සපයන්නෙකු ලෙස හඳුනාගෙන ඇත. මෙම ක්ෂේත්‍රය ඉහළම සෘජු විදේශ ආයෝජන සහ ඉහළ මට්ටමේ ආයෝජක ව්‍යාපෘතිද රට වෙත ආකර්ෂණය කරයි.

## අධ්‍යක්ෂ / නීති

නීති අංශයේ ප්‍රධානී ලෙස සංකීර්ණ නීති කටයුතු සම්බන්ධයෙන් නායකත්වය ලබාදීමේ වගකීම දැරිය යුතු අතර අංශයන්හී අරමුණු එක් කරමින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අරමුණු ඉටුකිරීම සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සමගින් සමීපව සම්බන්ධවෙමින් කටයුතු කිරීම.

**රාජකාරීන්**

- සියලුම ආකාරයේ නීතිමය කරුණු සම්බන්ධයෙන් නීති අංශය හා ඉහළ කළමනාකාරීත්වයට මග පෙන්වීම.
- වර්තමාන කටයුතු මෙහෙයුම් හා ක්‍රමෝපායික මූල පිරීම් සම්බන්ධයෙන් මතුවිය හැකි අපේක්ෂිත නීතිමය ගැටළු හඳුනාගැනීමට ගතයුතු අවශ්‍ය ක්‍රියාමාර්ගයන්ට මූල පිරීම සහ තඩු කළමනාකරණය කිරීම.
- කොන්ත්‍රාත් කළමනාකරණය හා නියමනයන්ට අනුකූල වීම, තහවුරු කිරීම හා වගකීම දැරීම.
- නව අනෙකුත් අධිකරණ විෂයයන් හා මෙහෙයුම් ස්ථාපනය කිරීම සඳහා වන සම්බන්ධීකරණය කිරීම.
- ආයතනය පාලනය කරන ව්‍යුහයන් සමග නියාමනය අනුකූලතා සඳහා සහතික වීම, වගකීම දැරීම.
- අවිධිමත් අංශයේ ව්‍යාප්තිය අවම කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ විධිමත් අංශයේ නව ප්‍රදේශ අවශෝෂණය සහ එහි නිර්ණායක ක්‍රියාත්මක කිරීම.
- ඉඩම් බලෙන් අල්ලාගැනීමට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම හා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ඉඩම් ආරක්ෂා කිරීම.
- නීතිය බලාත්මක කිරීමේ කාර්යයන් ඉටුකිරීම.
- පනත තුලින් පැවරී ඇති බලතල මගින් අදාළ හා අවශ්‍ය නීතිය ක්‍රියාත්මක කිරීම අධ්‍යයනය කිරීම හා කළමනාකාරීත්වය දැනුවත් කිරීම.
- සංචාරක කර්මාන්තය සමග අන්තර් ක්‍රියාකරන අනෙකුත් අදාළ නීති හා රෙගුලාසි පිළිබඳව දැනුවත් කිරීම.
- පවතින සංචාරක පනත සඳහා වන සංශෝධන ඇතුළු පහසුකම් සැලසීම හා සංචාරක ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය සඳහා සාධාරණ ප්‍රතිපල සහිත ආදේශන සඳහා යෝජනා ඉදිරිපත් කිරීම.

**අපේක්ෂිත පුද්ගලයා**

**බාහිර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිවේදී උපාධියක් ලබා තිබීම හා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු ලෙස දිවුරුම් දී තිබීම සහ සිංහල සහ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කරනු ලබන නොතාරිස්වරයෙකු වීම සමග නීති ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

සහ

දිවුරුම් දීමෙන් පසුව වසර පහළොවක (15) රජයේ, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" තනතුරක අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

02. කළමනාකරණ සේවා (MM 1-2) සේවා ගණයෙහි I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක අදාළ විෂය ක්ෂේත්‍රයේ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම.

**වයස**

අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. ( උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ).

**වැටුප් පරිමාණය**

HM 1-1 - රු. 140,640 – 15 x රු. 4,100/- රු. 202,140 කි

මූලික වැටුප - රු. 105,399 + ජීවන වියදම් දීමනාව

ප්‍රතිලාභ

- සේවකයා සහ පවුල ආවරණය වන පරිදි ආකර්ශනීය වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක්
- ප්‍රවාහන දීමනාව
- දුරකථන දීමනාව
- වෘත්තීය දීමනාව
- ණය පහසුකම්
- වෘත්තීය දියුණුව සඳහා පුහුණු

තනතුරට සුදුසු යැයි ඔබ සිතන්නේ නම් අදාළ අයදුම්පත සමග ඔබගේ ජීව දත්ත ඇතුලත් අයදුම්පත (CV) ද අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්, සේවා පළපුරුද්ද සඳහා වන සහතික පිටපත් සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් සමග ලියාපදිංචි තැපෑලෙන් 2025 මැයි 09 වන දින හෝ ඊට පෙර "සහකාර අධ්‍යක්ෂ/ නීති" ලෙස ලිපිකවරයේ වම්පස ඉහළ කෙලවරේ සටහන්කර පහත ලිපිනයට යොමු කරන්න.

**සභාපති,**
**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය,**
**අංක: 80, ගාලු පාර, කොළඹ 03.**